සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 10 | භූගෝල විද්‍යාව | 3 | 05. ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත |

සැකසුම: එන්. ඩී චන්ද්‍රා කාන්ති

බප/හො/ නාහල්ල මහා විද්‍යාලය









# නිෂ්පාදන කර්මාන්ත යනු:

මිනිසා සතු ශිල්පීය ඥානය හා තාක්ෂණික ඥානය යොදා ගනිමින් නිෂ්පාදන සාධක සමඟ ස්වාභාවික සම්පත් හැසිරවීම මගින් මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය යි

# ලෝකයේ ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත

- යකඩ හා වානේ කර්මාන්තය
- මෝටර් රථ කර්මාන්තය
- නැව් තැනීමේ කර්මාන්තය
- විද්‍යුත් (ඉලෙක්ට්‍රොනික්) කර්මාන්තය
- කපු පිළි කර්මාන්තය

# යකඩ හා වානේ කර්මාන්තය

- බොහෝ රටවල කාර්මීකරණයේ පදනම වී ඇත්තේද යකඩ හා වානේ කර්මාන්තය යි.
- කුඩා ගෘහ උපකරණයේ සිට නැව්, ගුවන්යානා තැනීම දක්වාම මෙම කර්මාන්තය දායක වී ඇත.


**කර්මාන්තය ස්ථානගත වීමට බලපාන සාධක**

- අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව
- ප්‍රවාහන පහසුව
- බල ශක්තිය
- වෙළඳපොළ
- ප්‍රාග්ධනය
- ශ්‍රමය
- තාක්ෂණය
- යටිතල පහසුකම් හා ජලය ලබා ගැනීමේ පහසුකම්


# ව්‍යාප්තිය

- චීනය
- ජපානය
- මහා බ්‍රිතාන්‍ය ඇතුළු බටහිර යුරෝපය
- රුසියාව
- ඇමරිකා එක්සත් ජනපදය
- බ්‍රසීලය
- ඉන්දියාව
- දකුණු කොරියාව

# ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදන ප්‍රදේශ









යපස් නිධියක්

යකඩ නිෂ්පාදන

# යකඩ හා වානේ කර්මාන්තයේ ලක්ෂණ හා නව ප්‍රවණතා

- යකඩ හා වානේ වලට පවතින විශේෂ ගුණාංග
  උදා: කල්පැවැත්ම, නම්‍යශීලීබව, ශක්තිය දරා සිටීමෙ හැකියාව
- ගල් අඟුරු වෙනුවට විකල්ප බල ශක්තිය යෙදවීම
- වානේ නිෂ්පාදනයට සුන්බුන් යකඩ භාවිතා කිරීම
- නවීන තාක්ෂණයෙන්  යුත් විශාල කර්මාන්ත ඇති කිරීම
- නිෂ්පාදන කටයුතු නවීකරණය වීම

- වෙනත් ලෝහ වලට මිශ්‍ර කිරීමෙන් ගුණාත්මක බව වැඩි දියුණු කරගත හැකිවීම
- අතීතයේ යකඩ හා වානේ නිෂ්පාදනයේ ප්‍රමුඛ වූ ඇතැම් රටවල් පසුබැසීම
- ජාත්‍යන්තර වෙළඳාමේදී වානේ අපනයනය කරන ඇතැම් රටවල් විසින්ම වානේ ආනයනය කිරීම. (උදා: චීනය, දකුණු කොරියාව)
- අතීතයේ අමුද්‍රව්‍ය මත එම ප්‍රදේශවලම කර්මාන්ත ස්ථානගත වුවද වර්තමානයේදී වෙනත් සාධක (ප්‍රාග්ධනය, වෙළෙඳපොළ) මත ස්ථානගත වීමේ නැඹුරුවක් පැවතීම

# ලෝකයේ මෝටර් රථ කර්මාන්තය

- 20වන සියවසේ ලෝකයේ විශිෂ්ඨ ස්ථානයක් හිමි කර්මාන්තයකි
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස වර්ධනය වී ඇත.


## ව්‍යාප්ත ප්‍රදේශ

- චීනය
- ජපානය
- ඇමරිකා එක්සත් ජනපදය
- යුරෝපා හවුල
- ජර්මනිය
- දකුණු කොරියාව
- ඉන්දියාව
- බ්‍රසීලය
- මෙක්සිකෝව
- තායිලන්තය

# Top 30 Motor Vehicle Producing Countries

*Source: International Organization of Motor Vehicle Manufakturers (OICA), 2016*

**Included cars, trucks, coaches and buses*



| | Total motor vehicles* (thousands) | Produced motor vehicles per 1,000 capita |
|---|---|---|
| 1. China | 28,119 | 20.4 |
| 2. US | 12,198 | 37.3 |
| 3. Japan | 9,205 | 72.8 |
| 4. Germany | 6,063 | 75.2 |
| 5. India | 4,489 | 3.5 |
| 6. South Korea | 4,229 | 82.6 |
| 7. Mexico | 3,597 | 28.9 |
| 8. Spain | 2,886 | 59.0 |
| 9. Canada | 2,370 | 66.5 |
| 10. Brazil | 2,156 | 10.4 |
| 11. France | 2,082 | 31.0 |
| 12. Thailand | 1,944 | 28.4 |
| 13. UK | 1,817 | 28.0 |
| 14. Turkey | 1,486 | 18.4 |
| 15. Czech Rep. | 1,350 | 126.5 |

| | Total motor vehicles* (thousands) | Produced motor vehicles per 1,000 capita |
|---|---|---|
| 16. Russia | 1,304 | 9.2 |
| 17. Indonesia | 1,177 | 4.5 |
| 18. Iran | 1,165 | 14.2 |
| 19. Italy | 1,104 | 17.8 |
| 20. Slovakia | 1,040 | 191.0 |

| | Total motor vehicles* (thousands) | Produced motor vehicles per 1,000 capita |
|---|---|---|
| 21. Poland | 682 | 17.7 |
| 22. South Africa | 599 | 10.9 |
| 23. Malaysia | 513 | 16.3 |
| 24. Argentina | 473 | 10.7 |
| 25. Hungary | 472 | 47.9 |
| 26. Belgium | 399 | 34.7 |
| 27. Romania | 359 | 16.7 |
| 28. Taiwan | 310 | 13.2 |
| 29. Sweden | 205 | 20.6 |
| 30. Australia | 161 | 6.9 |

FactsMaps.com


AMBULANCE


# මෝටර් රථ කර්මාන්තය ස්ථානගතවීමට බලපා ඇති සාධක

- යකඩ හා වානේ නිෂ්පාදනය දියුණු වී තිබීම
- භූමිය, යටිතල පහසුකම්
- බලශක්තිය
- තාක්ෂණික ඥානයකින් යුත් ශ්‍රමිකයන් සිටීම
- ශ්‍රමය ලබා ගැනීමේ පහසුව
- වෙළඳපොළ

# මෝටර් රථ කර්මාන්තයේ ලක්ෂණ හා නව ප්‍රවනතා

- ශීඝ්‍රයෙන් වෙනස්වන කර්මාන්තයක් වීම
- රොබොටික් තාක්ෂණය භාවිතය
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වීම
- අති සුඛෝපභෝගී මෝටර් රථ නිෂ්පාදනය
- ඉන්ධන පිරිමැසීම සඳහා සැහැල්ලු මෝටර් රථ නිෂ්පාදනය
- ආරක්ෂා සහිත වාහන නිෂ්පාදනය
- ඛනිජ තෙල් වෙනුවට විකල්ප බල ශක්ති භාවිතය
- පරිගණක තාක්ෂණයෙන් මෝටර් රථවල ක්‍රියාකාරීත්වය පහසු කිරීම
- ගොඩ, මඩ, දිය පොදුවේ භාවිත කළ හැකි නිෂ්පාදන එළි දැක්වීම

  උදා: වායු පායානය (Mover craft)

# නැව් තැනීමේ කර්මාන්තය

- අන්තර්ජාතික වෙළඳාමේදී භාණ්ඩ හුවමාරුව හාධීවර කටයුතු වෙනුවෙන්ද අවශ්‍ය කුඩා ප්‍රමාණයේ සිට විශාල නැව් දක්වා නැව් නිෂ්පාදනය කෙරේ.

උදා:යුධ නැව්, ධීවර නැව්, සුඛෝපභෝගී යාත්‍රා,ඛනිජ තෙල් ප්‍රවාහන නැව්, භාණ්ඩ හා මගී ප්‍රවාහන නැව්







# නැව් තැනීමේ කර්මාන්තය ස්ථානගතවීමට බලපා ඇති සාධක

- නැව් තටාංගන පහසුකම්
- දැව ලබාගත හැකි වනාන්තර තිබීම
- තැනිතලා භූමිය හා කඩතොලු සහිත ගැඹුරු වෙරළක් තිබීම
- විශාල ප්‍රාග් ධනයක් ආයෝජනය කළ හැකිවීම
- අමුද්‍රව්‍ය ලෙස යකඩ හා වානේ පහසුවෙන් ලබා ගත හැකිවීම
- පුහුණු ශ්‍රමය ලබා ගැනීමේ පහසුව
- තාක්ෂණික ඥානය
- අධි තාක්ෂණික උපාංග ලබා ගැනීමේ පහසුව
- රාජ්‍ය අනුග්‍රහය

# ව්‍යාප්තිය

- බ්‍රිතාන්‍යය
- ඇමරිකා එක්සත් ජනපදය
- නෝර්වේ
- නෙදර්ලන්තය
- ජපානය
- චීනය
- දකුණු කොරියාව
- තායිවානය
- ඩෙන්මාර්කය
- පෝලන්තය
- ස්වීඩනය
- ජර්මනිය
- ප්‍රංශය

# නැව් තැනීමේ කර්මාන්තයෙහි ලක්ෂණ හා නව ප්‍රවණතා

- සුවිශේෂී නැව් නිෂ්පාදනය (මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය, සෞඛ්‍ය, පර්යේෂණ ආදී)
- අතිවිශාල අධි සුඛෝපභෝගී නැව් නිෂ්පාදනය
- විවිධ කාර්යයන් සඳහා නැව් නිෂ්පාදනය කිරීම

උදා: යුධ කටයුතු, සාගර ගවේෂණ, ධීවර නිෂ්පාදන, කම්හල්, පුස්තකාල

- නූතන තාක්ෂණය යොදා ගැනීම. උදා: රොබොටික් සහ යාන්ත්‍රික තාක්ෂණය
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස වර්ධනය වීම
- අතීතයේදී අමුද්‍රව්‍ය ලෙස යකඩ හා වානේ යොදා ගත්තද වර්තමානයේ සැහැල්ලු ලෝහ, ෆයිබර් හා ආදේශක යොදාගෙන සැහැල්ලු යාත්‍රා නිෂ්පාදනය
- නැව් නිෂ්පාදනයට යොදා ගන්නා බලශක්තිය වෙනස්වීම

උදා: ගල්අඟුරු, ඛනිජතෙල්, න්‍යෂ්ඨික බලය....


# විද්‍යුත් කර්මාන්තය

- මිනිසුන්ගේ ජීවිතයේ දී එදිනෙදා කාර්යයන් පහසු කරලීම සඳහාත් තොරතුරු සන්නිවේදනය සඳහාත් උපකාර වන මෙවලම් විද්‍යුත් කර්මාන්ත යටතේ නිෂ්පාදනය කරයි.

## විද්‍යුත් කර්මාන්තයේ යෙදෙන රටවල්

- ජපානය
- මහා බ්‍රිතාන්‍ය
- ඇමරිකා එක්සත් ජනපදය
- ජර්මනිය
- ප්‍රංශය
- චීනය
- දකුණු කොරියාව
- හොංකොං
- සිංගප්පූරුව
- මැලේසියාව
- තායිවානය
- ඉන්දියාව

# විද්‍යුත් කර්මාන්තය ව්‍යාප්ත ප්‍රධාන රටවල් කිහිපයක්



# විද්‍යුත් කර්මාන්තය ස්ථානගත වීමට බලපා ඇති සාධක

- වෙළෙඳපොළ
- විශාල ප්‍රාග්ධනයක් යෙදවීමේ හැකියාව
- අධිතාක්ෂණය
- විශේෂඥ දැනුම හා විශේෂ නිපුණතාවයකින් යුත් ශ්‍රමිකයන් සිටීම

# විද්‍යුත් කර්මාන්තයේ ලක්ෂණ හා නව ප්‍රවණතා

- විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබීම
- පර්යේෂණ කිරීම සඳහා විශාල ප්‍රාග්ධනයක් වැය කිරීම
- ශ්‍රමිකයන්ගෙන් විශාල පිරිසක් විද්‍යාඥයින්, ඉංජිනේරුවන්, පුහුණු කාර්මික ශිල්පීන් හා පර්යේෂකයන් වීම
- බොහෝවිට නිෂ්පාදක අයිතිය බහුජාතික සමාගම් සතුවීම
- වෙළඳපොළ තරඟකාරීත්වයට ගැලපෙන පරිදි දිනෙන් දින නව නිෂ්පාදන එළිදැක්වීම (ජංගම දුරකථන, කැමරා, රූපවාහිනී යන්ත්‍ර)
- ඉතාමත් සංකීර්ණ සූක්ෂම භාණ්ඩ හා උපාංග නිෂ්පාදනය

  උදා: වීඩියෝ උපකරණ, චිප්ස්, කැමරා
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස පවත්වා ගැනීම
- විද්‍යුත් උපකරණ අපනයනය කරන රටවල්ම වෙනත් රටවල් වලින් විද්‍යුත් උපකරණ ආනයනය
- අතුරු නිෂ්පාදන වෙළඳපොළක් ඇතිවීම

  උදා: Virus නිෂ්පාදනය, Virus guard, CD/ DVD තැටි කර්මාන්තය

# කපු පිළි කර්මාන්තය


- 18 වන සියවසේදී ඇතිවූ කාර්මික විප්ලවයත් සමඟ කපු පිළි කර්මාන්තය ව්‍යාප්ත විය
- කපු පිළි නිෂ්පාදනය කරන රටවල්
  - චීනය
  - ඉන්දියාව
  - ජපානය
  - ඊජිප්තුව
  - එක්සත් රාජධානිය
  - ප්‍රංශය
  - ජර්මනිය
  - ඉතාලිය
  - බෙල්ජියම
  - ඇමරිකා එක්සත් ජනපදය
  - බ්‍රසීලය




# කපු පිළි කර්මාන්තය ව්‍යාප්ත රටවල්






Spinning
Weaving
Textile Manufacturing Process
Garments Manufacturing
Dyeing + Printing + Finishing

# කපු පිළි කර්මාන්තය ස්ථානගත වීමට බලපා ඇති සාධක

- දේශගුණය
- ලාභදායී ශ්‍රමය
- නවීන තාක්ෂණය
- ප්‍රවාහන පහසුව
- වෙළෙඳපොළ

# කපු පිළි කර්මාන්තයේ ලක්ෂණ හා නව ප්‍රවණතා

- කපු පිළි නිෂ්පාදන කර්මාන්තයට දිගු ඉතිහාසයක් පැවතීම
- කෘෂි පාදක අමුද්‍රව්‍ය මත පදනම් වීම
- කපු වගා කරන රටවලින්  බැහැරව කර්මාන්ත ස්ථානගත වීම
- යාන්ත්‍රීකරණය වීම
- අතීතයේදී ප්‍රමුඛයන් යුරෝපා රටවල් වුවද, 21 වන සියවසේ දෙවන භාගයේ සිට නැගෙනහිර ආසියාතික රටවල් ප්‍රමුඛ වීම
- කපු හා කෘතීම කෙඳි සමඟ මිශ්‍රිත නිෂ්පාදන කිරීම

  අතුරු කර්මාන්ත බිහිවීම (වර්ණ ගැන්වීම්, ඇඟලුම් නිෂ්පාදනය)
- පරිසර හිතකාමී නිෂ්පාදනයක් වීම
- කපු පිළි ආශ්‍රිත නිෂ්පාදනවලට ඉල්ලුම වැඩිවීම

# නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත ගැටලු

- අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටලු (උදා: අමුද්‍රව්‍ය ක්ෂය වීම)
- ශ්‍රමය සපයා ගැනීමේ ගැටළු
- පරිසර දූෂණය
- බහුජාතික සමාගම්වල බලපෑම්
- වෙළෙඳපොළ ගැටලු (උදා: තරඟය)
- බලශක්ති අර්බුදය
- ප්‍රාග්ධන හිඟය
- නිෂ්පාදන පිරිවැය ඉහළ යාම
- රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ගැටළු

**සවියෙන් පෙරට - අපි එකට**

**e-ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 10 | භූගෝල විද්‍යාව | 3 | 05. ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත - පිළිතුරු |

**සැකසුම: එන්.ඩී. චන්ද්‍රා කාන්ති**

**බප/හො/ නාහල්ල ශ්‍රී රේවත ම.වි**

01. අමුද්‍රව්‍ය, ප්‍රාග්ධනය, ශ්‍රමය

02. චීනය, රුසියාව, ජපානය, ඉන්දියාව, එක්සත් රාජධානිය

03. චීනය හා ජපානය

04. විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කල හැකි නිසා

05. චීනය

06. *මෝටර් රථ නිෂ්පාදනය සඳහා යාන්ත්‍රික ශ්‍රමය යොදා ගැනීම (රොබෝ යන්ත්‍ර,ස්වයංක්‍රීය යන්ත්‍ර )

    *එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස වර්ධනය වීම

07. බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, චීනය, නෝර්වේ

08. * නැව් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය වන දැව හා වානේ පහසුවෙන් ලබා ගත හැකි වීම

    * නැව් තටාකාංගන පහසුකම් තිබීම හා (කඩතොලු සහිත වෙරළ ප්‍රදේශ තිබීම )

09. ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, පරිගණක

10. චීනය

11. ප්‍රධාන සාධක- යපස් කෙත් බහුල වීම සහ තාක්ෂණික දියුණුව

*යකඩ හා වානේ නිෂ්පාදනය සඳහා අවශ්‍ය ප්‍රධානතම අමුද්‍රව්‍ය යපස්ය.

* චීනයේ දකුණු වැන්ඩුරියා ප්‍රදේශය, බීජිං ප්‍රදේශය හා ෂන්ෂුවාං ප්‍රදේශයෙහි යකඩ හා වානේ කර්මාන්තය නිෂ්පාදන මධ්‍යස්ථාන ස්ථානගත වී ඇත්තේ අමුද්‍රව්‍ය පදනම් කොට ගෙනය.

*කර්මාන්තයට අවශ්‍ය වන යපස් එනම් ප්‍රධාන අමුද්‍රව්‍ය පොළොවෙන් හාරා ගැනීමට අවශ්‍ය තාක්ෂණයත් අඩු වටිනාකමකින් යුක්තව පැවති යපස් කෙත්ද අධිතාක්ෂණය භාවිතා කරමින් ඵලදායි ලෙස නැවත ප්‍රයෝජනයට ගැනීමට චීනය කටයුතු කරයි.

12. * අධිසුඛෝපභෝගී මෝටර් රථ නිෂ්පාදනය

* එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස වර්ධනය වීම

* නවීන තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා ගැනීම

*වර්තමානයේදී දක්නට ලැබෙන ප්‍රධාන ප්‍රවණතාවයක් නම් අධි සුඛෝපභෝගී රථ වාහන මගීන් ප්‍රවාහනය සඳහා නිෂ්පාදනය කිරීමයි.

* ඒ සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළෙඳ පොළේද මෙවැනි මෝටර් රථ සඳහා ඉහළ ඉල්ලුමක් පවතී.

*වර්තමානයේදී ලෝක මෝටර් රථ නිෂ්පාදනය එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස තායිවානය, දකුණු කොරියාව, සිංගප්පූරුව, ඉන්දුනීසියාව වැනි රටවල ව්‍යාප්ත වී ඇත.

*වර්තමානයේදී චීනය, ජපානය, ඇ.එ. ජනපදය වැනි රටවල් මෝටර් රථ නිෂ්පාදන කටයුතු සඳහා නවීන තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතා කරයි. උදා: මෝටර් රථ නිෂ්පාදනයෙදී අනතුරුදායක කටයුතු සඳහා මෙන්ම නිරවද්‍යතාව සකස් කිරීම සඳහා රොබෝ යන්ත්‍ර භාවිතා කරයි.

*බොහෝ මෝටර් රථ නිපදවීමේ කටයුතු වලදී යාන්ත්‍රික ශ්‍රමය බහුල ලෙස භාවිත කෙරේ.

13. * සංවර්ධිත රටවලට විශාල ප්‍රාග්ධනයක් වැය කළ හැකි වීම, අමුද්‍රව්‍ය ලෙස යකඩ හා වානේ පහසුවෙන් ලබාගතහැකි වීමත් සහ එම රටවල් ලබා තිබූ කීර්තිනාමය හා පළපුරුද්දත් හේතුවෙන් මුල් කාලයේදී සංවර්ධිත රටවලට පමණක් නැව් තැනීම සීමා සහිත විය.

*නමුත් වර්තමානයේදී චීනය, දකුණු කොරියාව, ජපානය වැනි රටවල් ඔවුන් සතුව ලාභදායී ශ්‍රමය හා පුහුණු ශ්‍රමය,නව තාක්ෂණය, තටාකාංගන පහසුකම් සඳහා කඩතොලු සහිත වෙරළ ප්‍රදේශ පැවතීම හේතුවෙන් නැව් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් බවට පත්ව ඇත.

*චීනය, ජපානය, දකුණු කොරියාව වැනි රටවලට පහසුවෙන් ලාභදායී ශ්‍රමය ලබා ගැනීමට හැකි වීම මෙන්ම පුහුණු ශ්‍රමය ලබාගැනීමේ හැකියාව මත නැව් නිෂ්පාදනයේ දියුණුවක් ලගා කර ගෙන ඇත.එම රටවල ජන සංඛ්‍යාව අධික වීමත්, ලාභදායී ලෙස පුහුණු ශ්‍රමය ලබාගැනීමට හැකිවීමත් මේ සඳහා බලපා ඇත.

* චීනය,ජපානය හා දකුණු කොරියාව වැනි රටවල පවතින නව තාක්ෂණික දියුණුව නිසාද නැව් නිෂ්පාදනයේ ශීඝ්‍ර දියුණුවට ඉවහල් වී ඇත. උදා: රොබෝ තාක්ෂණයයොදාගැනීම සහ විවිධ යාන්ත්‍රික ශ්‍රමය භාවිතා කිරීම.

* එසේම මෙම රටවල් සතු කඩතොලු සහිත වෙරළ ප්‍රදේශ පැවතීම නිසාද නැව් තටාකාංගන පහසුකම් තිබීම නිසාද නැව් නිශ්පාදන කර්මාන්තයේ ශීඝ්‍ර වර්ධනයට බලපා තිබේ.

**14.** <u>ප්‍රවණතා</u>

*කපු පිළි නිෂ්පාදනය යාන්ත්‍රිකරණය වීම නිසා තත්වයෙන් උසස් නිෂ්පාදන බිහි වීම.

*කපු හා කෘත්‍රිම කෙඳි සමග මිශ්‍රිත නිෂ්පාදන ඇති වීම, ලෝම, හණ ආදී කෙඳි සමග මිශ්‍ර කර විවිධ ගුණාත්මක බවින් වැඩි නිශ්පාදන සිදු කිරීම නිසා මෙම කපු පිළි ආශ්‍රිත නිෂ්පාදන වලට ඉල්ලුම වැඩි වී ඇත.

* කපු පිළි කර්මාන්තය යාන්ත්‍රිකරණය වීම සහ යාන්ත්‍රික ශ්‍රමය යොදා ගැනීම සිදු වී ඇත. ඒ අනුව උසස් කපු පිළි නිෂපනාදන බිහි වී ඇති අතර, කපු පිළි ආශ්‍රිත නිෂ්පාදනවල ලෝක දේශීය මෙන්ම විදේශීය වෙළඳ පොලේ ඉල්ලුම ද වැඩි වී ඇත.

<u>ගැටළු</u>

*කපු වගාවට ස්වාභාවික උපද්‍රව හා දේශගුණික විපර්යාස වලට මුහුණ පෑමට සිදු වීම.

*කෘත්‍රිම රෙදිපිළි කර්මාන්තය නිසා, කපු පිළි නිෂ්පාදන සඳහා වෙළෙඳපොලේ ඉහළ ඉල්ලුමක් පැවතියද කෘත්‍රිම කෙඳි වර්ග නිෂ්පාදන වලින් දැඩි තරගයක් එල්ල වී ඇත.

15. 1. අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළු
    2. නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, අමුද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ඉහළ පිරිවැය දැරීමට සිදුවීම යාන්ත්‍රිකරණය වීම නිසා යන්ත්‍ර සූත්‍ර සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වී ඇත.
    3. දේශීය හා විදේශීය වෙළෙඳපල තරගකාරිත්වය

බොහෝ රටවලට වෙළෙඳපොල ඉල්ලුමට සරිලන ලෙස තත්ත්වයෙන් උසස් ඉහළ නිෂ්පාදන ඉදිරිපත් කිරීමට සිදුවේ. මේ නිසා නිෂ්පාදන මිල ඉහළ යාම දක්නට ලැබේ. එමෙන් විවිධ භාණ්ඩ සඳහා ආදේශක වෙළෙඳ පොළට පැමිණීමද ගැටළුවකි.

4. බලශක්ති අර්බුදය

ඛණිජ තෙල් මිල ඉහළ යාම, බලශක්ති සම්පත් ක්ෂය වීම, බලශක්ති ඇති රටවල පවතින දේශපාලන ගැටුම්, න්‍යෂ්ටික බලශක්තිය නිසා පාරිසරික ගැටලු මතුවීම ආදිය නිසා ලෝක නිෂ්පාදන කර්මාන්ත ප්‍රබල බලශක්ති අර්බුදයකට මුහුණපාමින් සිටී.

5. ශ්‍රමය සපයා ගැනීම ආශ්‍රිත ගැටළු

අවශ්‍යා පුහුණු ශ්‍රමය, නිපුණතාවලින් සමන්විත ශ්‍රමය, ශිල්පීය ඥානය අඩු මට්ටමක් පවතී. මේ නිසා ශ්‍රම වියදම් වැඩිවීම, කර්මාන්ත යාන්ත්‍රික ශ්‍රමයට නැඹුරු වීම නිසාද ප්‍රබල රැකියා හිඟයක් පවතී. එසේම කම්කරු ගැටළු පැන නැගීම ද මෙම කර්මාන්ත ආශ්‍රිත ප්‍රබල ගැටලුකාරී තත්ත්ව මතු කරයි.

6. විවිධ කර්මාන්ත සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය ක්ෂය වෙමින් පැවතීමත්, ස්වාභාවික අමුද්‍රව්‍ය වෙනුවට කෘත්‍රිම අමුද්‍රව්‍ය යොදා ගැනීමට සිදුවීම ගැටළුවකි.

**සවියෙන් පෙරට - අපි එකට**

**e-ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
| --- | --- | --- | --- |
| **10** | භූගෝල විද්‍යාව | 3 | 05. ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත - ඇගයීම |

**සැකසුම: එන්.ඩී. චන්ද්‍රා කාන්ති**

**බප/හො/ නාහල්ල ශ්‍රී රේවත ම.වි**

01. කර්මාන්ත ස්ථානගතවීමට බලපාන සාධක තුනක් නම් කරන්න.

02. ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තය සිදු කෙරෙන ප්‍රධාන රටවල් පහක් නම් කරන්න.

03. ලෝකයේ යකඩ හා වානේ අපනයනය කරන ප්‍රමුඛතම රටවල් දෙක නම් කරන්න.

04. අතීතයේදී සංවර්ධිත රටවල් මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රමුඛයන් බවට පත්වීමට හේතුව කුමක්ද ?

05. 2012 වර්ෂය වන විට මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රමුඛතම රට කුමක් ද?

06. නූතන මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ ශීඝ්‍ර දියුණුවට හේතු වී ඇති කරුණු දෙකක් සඳහන් කරන්න.

07. ලෝකයේ නැව් නිෂ්පාදනය කෙරෙන ප්‍රධාන රටවල් පහක් නම් කරන්න.

08. යුරෝපා රටවල නැව් තැනීමේ කර්මාන්තය දියුණුවීමට බලපෑ හේතු සාධක දෙකක් සඳහන් කරන්න.

09. ලෝකයේ විද්‍යුත් කර්මාන්තය යටතේ නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ තුනක් නම් කරන්න.

10. වර්තමානයේ ලෝක විද්‍යුත් කර්මාන්ත ක්ෂේත්‍රයේ බලවත් ම රාජ්‍යය කුමක්ද?

11. චීනයේ යකඩ හා වානේ නිෂ්පාදන කර්මාන්තයේ දියුණුවට බලපා ඇති සාධක දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

12. ලෝකයේ මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව දක්නට ලැබෙන නව ප්‍රවනතා තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

13. මුල්කාලයේදී නැව් තැනීමේ කර්මාන්තයට යොමු වී ඇත්තේ සංවර්ධිත රටවල් පමණක් වුවත් වර්තමානයේදී මේ තත්වය වෙනස් වීමට බලපෑ හේතු සාධක තුනක් කෙටියෙන් පහදන්න.

14. ලෝකයේ කපු පිළි නිෂ්පාදන කර්මාන්තයේ ලක්ෂණ හා ප්‍රවණතා දෙකක් හා කපු පිළි කර්මාන්තයේ නියුතු රටවල් වර්තමානයේදී මුහුණපාන ගැටලු දෙකක් ද කෙටියෙන් හඳුන්වන්න.

15. ලෝක නිෂ්පාදන කර්මාන්ත මුහුණ පාන ගැටළු පහක් කෙටියෙන් හඳුන්වන්න.